භාණ්ඩ හා සේවා සැපයුම්කරුවන් සහ කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම- 2026

# නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය

**ප්‍රවාහන, මහාමාර්ග හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය**

**2026** වර්ෂය සඳහා භාණ්ඩ හා සේවා සැපයුම්කරුවන් සහ කොන්ත්‍රාත්කරුවන් වශයෙන් ලියාපදිංචි කිරීම සඳහා නිෂ්පාදකයන්ගෙන්/භාණ්ඩ හා සේවා සැපයුම්කරුවන්ගෙන්/ කොන්ත්‍රාත්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවීම.

| **1. සැපයුම්** | | **අයිතම අංකය** |
|---|---|---|
| 1. | සියළුම කාර්යාල ලිපි ද්‍රව්‍ය හා කාර්යාල උපකරණ. | 1.1 |
| 2. | කාර්යාල ලී බඩු හා වානේ නිෂ්පාදන (අල්මාරි,පුටු,මේස,කැබිනට්). | 1.2 |
| 3. | පරිගණක, මුද්‍රණ යන්ත්‍ර (Printer) ,ඡායා පිටපත් යන්ත්‍ර, ෆැක්ස් යන්ත්‍ර ඇතුළු සියළු ඉලෙක්ට්‍රොනික උපාංග හා අමතර කොටස්. | 1.3 |
| 4. | පරිගණක මෘදුකාංග. | 1.4 |
| 5. | සියළුම ගොඩනැගිලි ද්‍රව්‍ය. | 1.5 |
| 6. | ඕෆ් සෙට් හා ඩිජිටල් මුද්‍රණ කටයුතු. | 1.6 |
| 7. | සියළුම ටෝනර් වර්ග හා කාට්රිජ් වර්ග. | 1.7 |
| 8. | ආහාර පාන සැපයීම හා සංග්‍රහ කටයුතු. | 1.8 |
| 9. | තැගි භාණ්ඩ හා සිහිවටන, ලෝහමය ලාංඡන කුසලාන හා පදක්කම් සාදා සැපයීම. | 1.9 |
| 10. | වායුසමීකරණ යන්ත්‍ර,කම්ප්‍රෙෂර් සහ වායුසමීකරණ අමතර කොටස්. | 1.10 |
| 11. | ටී ෂර්ට්,හිස්වැසුම්,කොඩි හා බැනර් මුද්‍රණය කොට මසා සැපයීම. | 1.11 |
| 12. | රෙදිපිළි සැපයීම | 1.12 |
| 13. | ක්‍රීඩා උපකරණ සැපයීම | 1.13 |
| 14. | සෞඛ්‍යය උපකරණ සැපයීම | 1.14 |
| 15. | ස්වයං රැකියා හා කර්මාන්ත සඳහා අවශ්‍ය උපකරණ | 1.15 |
| 16. | සංගීත භාණ්ඩ | 1.16 |

| **2. සේවා** | | **අයිතම අංකය** |
|---|---|---|
| 1. | සියළුම කාර්යාල ලී බඩු හා උපකරණ අලුත්වැඩියාව | 2.1 |
| 2. | උත්සව භාණ්ඩ හා ශබ්ද විකාශණ යන්ත්‍ර කුලියට ගැනීම | 2.2 |
| 3. | කාර්යාලීය හැඳුනුම්පත් සකස්කිරීම හා ඡායා රූප කරනය | 2.3 |
| 4. | වායුසමීකරණ අලුත්වැඩියාව හා නඩත්තුකිරීම | 2.4 |
| 5. | ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ කුලීයට ලබාදීම | 2.5 |
| 6. | පරිගණක,මුද්‍රණ යන්ත්‍ර (Printer), ඡායා පිටපත් යන්ත්‍ර, රෝනියෝ මැෂින් අලුත්වැඩියාව හා සේවා කටයුතු | 2.6 |
| 7. | උත්සව සංවිධාන කටයුතු සිදු කිරීම.(Event Management) | 2.7 |
| 8. | නිර්මාණ/ නිශ්පාදන කටයුතු (වීඩියෝ ඩොකියුමන්ටරි) | 2.8 |
| 9. | දැන්වීම් නියෝජිත කටයුතු | 2.9 |
| 10. | බලය ලත් මිනින්දෝරු සේවා | 2.10 |

**3. කොන්ත්‍රාත්කරුවන්** **අයිතම අංකය**

| | | |
|---|---|---|
| 1. | ගොඩනැගිලි ඉදිකිරීම්, අලුත්වැඩියාකිරීම් හා වැඩිදියුණුකිරීම් (සුළු හා මධ්‍ය පරිමාණ) | 3.1 |
| 2. | කුඩා පරිමාණයේ මාර්ග ඉදිකිරීම් කොන්ක්‍රීට් කිරීම, ඇස්පෝල්ට් කිරීම සහ ඉන්ටලොක් ඇතිරීම (පිවිසුම් මාර්ග) /කාණු පද්ධති ඉදිකිරීම් | 3.2 |
| 3. | කාර්යාල වෙන් කිරීම් (partition work) | 3.3 |
| 4. | විදුලි කාර්මික වැඩ | 3.4 |
| 5. | අභ්‍යන්තර දුරකතන සේවා | 3.5 |
| 6. | Networking / CCTV Installation (සේවාවාර ගිවිසුම් සහිතව) | 3.6 |
| 7. | විදුලි සෝපාන පද්ධති ස්ථාපිත කිරීම හා නඩත්තු කිරීම | 3.7 |
| 8. | ජෙනරේටර් පද්ධති නඩත්තු කිරීම හා සේවා ගිවිසුම් | 3.8 |
| 9. | ගිනි ආරක්ෂණ හා නිවාරණ පද්ධති ස්ථාපනය කිරීම සහ නඩත්තු කිරීම | 3.9 |
| 10. | සෝලා පවර් (sola power) සැපයීම | 3.10 |
| 11. | ගෘහ අලංකරණය (interior designing) | 3.11 |
| 12. | යකඩ වැඩ හා ඇළුමිනියම් වැඩ | 3.12 |
| 13. | ජල ආරක්ෂ ආලේප කිරීමේ කොන්ත්‍රාත්කරුවන් | 3.13 |
| 14. | ජලනල පද්ධති සැකසීම හා ජල බූස්ටර පද්ධති සකස් කිරීම | 3.14 |
| 15. | බාහිර හා අභ්‍යන්තර මලාපවහන පද්ධති සැකසීම සඳහා බලයලත් කොන්ත්‍රාත්කරුවන් | 3.15 |
| 16. | ජලනල පද්ධතියේ පොම්ප සහ මලාපවහන පද්ධතියේ පොම්ප සැපයීම හා අළුත්වැඩියා කිරීම | 3.16 |
| 17. | ගලි වලවල්, මනුවලවල් (Man hole), ග්‍රීස් ට්‍රැප් හා මල නාලිකා පද්ධතිය අළුත්වැඩියා හා පිරිසිදු කිරීම | 3.17 |

**4. වාහන අලුත්වැඩියා (සැපයුම් හා සේවා)**

| | | |
|---|---|---|
| 1. | මෝටර් රථ අමතර කොටස් හා උපාංග. | 4.1 |
| 2. | ටයර්,ටියුබ්, බැටරි ( Wheel Alignment and balancing ඇතුළුව). | 4.2 |
| 3. | මෝටර් රථ අලුත්වැඩියා කිරීම. | 4.3 |
| 4. | වාහන වාර සේවා කටයුතු, ඉන්ටීරිය එක්ස්ටීරිය ක්ලිනින් | 4.4 |
| 5. | වාහන ටින්කර් කිරීම, පේන්ට් කිරීම, කට් ඇන්ඩ් පොලිෂ් කිරීම | 4.5 |
| 6. | වාහන කුෂන් වැඩ හා ඇතිරිලි වැඩ | 4.6 |
| 7. | වාහන වායුසමනය කිරීම | 4.7 |
| 8. | වාහන කුලියට ගැනීම කාර්/වෑන්/ලොරි/බස් | 4.8 |

- සියලු භාණ්ඩ හා සේවා සැපයුම්කරුවන් සහ කොන්ත්‍රාත්කරුවන් ව්‍යාපාර ලියාපදිංචිය සිදුකර තිබිය යුතුය.
- කොන්ත්‍රාත්කරුවන් වශයෙන් ලියාපදිංචි වීමට අදහස් කරන ආයතන/ පුද්ගලයින් ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියෙහි (CIDA) ලියාපදිංචි වී සිටිය යුතු අතර රජයේ දෙපාර්තමේන්තු/ ව්‍යවස්ථාපිත මණ්ඩල/ පළාත් පාලන ආයතන වල අදාළ වටිනාකම් වලට සමාන කොන්ත්‍රාත්/ කර්මාන්ත වැඩ සතුටුදායක ලෙස නිම කර ඇති බවට ලිඛිත සාක්ෂි අවශ්‍යතාවය අනුව ඉදිරිපත්කිරීමට හැකි විය යුතුය
- බලයලත් මිනින්දෝරු සේවා සැපයීමේදී 2026 වර්ෂය සඳහා මැනුම් සභාව විසින් වාර්ෂික මැනුම් බලපත්‍රයට අදාලව නිකුත් කර ඇති ලේඛන ඉදිරිපත් කිරීමට හැකි විය යුතුය.

- කොන්ත්‍රාත්කරුවන් විසින් අදාල සේවා සැපයුම් සිදු කිරීම සඳහා වන පළපුරුද්ද අනිවාර්ය ලිඛිත සාක්ෂි සහිතව ඉදිරිපත් කල යුතුය.
- සාම්පල් කැඳවන අවස්ථාවන්හීදී සාම්පල් ඉදිරිපත් කල යුතුය.
- සැපයුම් ද්‍රව්‍ය නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියට හෝ අධිකාරිය විසින් නියමකරනු ලබන ස්ථාන වෙත ගෙනවිත් භාරදිය යුතුය.
- අවශ්‍ය අවස්තාවන්හීදී අලෙවියෙන් පසු සේවාව ලබා දිය යුතුය.
- මිල ගණන් කැඳවීමේදී මිල කැඳවුම්පත් යොමු කල යුතු ලිපිනය ලබා දිය යුතුය.
- සැපයුම්කරුවෙකු ලෙස ලියාපදිංචිය සිදු කරන අවසාථාවේදී ලබා දෙන ලිපිනය, විද්‍යුත් ලිපිනය හා දුරකථන අංකයෙහි වෙනස්වීමක් සිදු වුවහොත් ඒ පිළිබඳව අධිකාරිය දැනුවත් කල යුතුය.
- සියලු සැපයුම්කරුවන් සහ කොන්ත්‍රාත්කරුවන් භාණ්ඩ හා සේවා සැපයීමෙන් පසු චෙක්පත් මඟින් ගෙවීම් සිදු කිරීමේ ක්‍රමවේදයට එකග විය යුතුය.
- ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් මෙන්ම බාහිර සැපයුම්කරුවන්ගෙන්ද මිල ගණන් කැඳවා අවශ්‍ය මිලදී ගැනිම් හා සේවාවන් ලබා ගැනීමේ අයිතිය අධිකාරිය සතුය.
- ලියාපදිංචි සැපයුම්කරුවන් වෙත වර්ෂය පුරාවට මිල ගණන් ඉදිරිපත් කිරීම සඳහා යොමු කරනු ලබන ඉල්ලීම් හරහා අධිකාරිය යම් පිරිවැයක් දැරීමට සිදුවන බැවින්, මිල ගණන් කැඳවීම් සිදු කරන අවස්ථාවේදී අඛණ්ඩව තුන්වතාවක් මිල ගණන් ඉදිරිපත් නොකරන, ඇණවුමක් කල විට සැපයීමට අපොහොසත් වන, නියමිත ප්‍රමිතියට අනුකූල නොවූ භාණ්ඩ හා සේවා සපයන සැපයුම්කරුවන්ගෙන් නම් පූර්ව දැනුම්දීමකින් තොරව අසාදු ලේඛනගත කිරීම්/ නැවත ඔවුන් වෙතින් අදාල වර්ෂය සඳහා මිල ගණන් කැඳවීමක් සිදු නොකරනු ලබයි.

සැපයුම්කරුවෙක් වශයෙන් ලියාපදිංචි වීම සඳහා එක් එක් අයිතමය වෙනුවෙන් ආපසු නොගෙවන **රු.1000/-** ක මුදලක් ලියාපදිංචි ගාස්තුව ලෙස ගෙවිය යුතුය.

සැපයුම්කරුවන් ලියාපදිංචි කිරිමේ ගාස්තු මුදලින් හෝ **සභාපති, නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය** නමට රේඛණය කරන ලද චෙක්පතක් මඟින් ගෙවීම් කල හැකි අතර සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත් සභාපති, නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය, 09 වන මහළ, සෙත්සිරිපාය, බත්තරමුල්ල යන ලිපිනයට **2025.12.26** දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් හෝ ගෙනවිත් බාරදෙන ලෙස කාරුණිකව දන්වා සිටිමි. (පුවත්පත් දැන්වීම පල කරන දිනයේ සිට සැපයුම්කරුවන් ලියාපදිංචි කරගනු ලැබේ.)
(විමසීම් - 0112-871306) ( www.usda.gov.lk ) (usdaprocurement13@gmail.com)

ලියාපදිංචිය සඳහා අවශ්‍ය විස්තර ඇතුලත් වන ඉල්ලුම්පත පහත දක්වා ඇත. ඉල්ලුම්පත් ඇතුලු ලියකියවිලි බහා එවනු ලබන කවරයේ වම් පස ඉහළ කෙලවරේ **"සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරිම 2026"** යනුවෙන් සඳහන් කල යුතුය.

**ආදර්ශ අයදුම්පත්‍රය**
**නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය**

**සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම 2026**

01. ලියාපදිංචිය අපේක්ෂා කරන අයිතමය හා අංකය:.............................................................................................................

02. සැපයුම්කරුගේ/ ආයතනයේ නම:.............................................................................................................

03. ලිපිනය :.............................................................................................................

04. දුරකථන අංකය/ෆැක්ස් අංකය :.............................................................................................................

05. විද්‍යුත් ලිපිනය (e-mail) :.............................................................................................................

06. ව්‍යාපාර ලියාපදිංචි අංකය/ ඉඩම් මිනුම් සභාවේ ලියාපදිංචි අංකය:.............................................................................................................

07. ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියෙහි (CIDA) ලියාපදිංචි අංකය :.............................................................................................................

08. වැට් ලියාපදිංචි අංකය /SSCL අංකය:.............................................................................................................

ව්‍යාපාරයක් ලෙස ලියාපදිංචි කිරිමේ සහතිකයෙහි පිටපතක්, වැට් (VAT) ලියාංපදිවි වී ඇත්නම් එහි පිටපතක් කොන්ත්‍රාත්කරුවෙකු ලෙස ලියාපදිංචි වීමට අදහස් කරන්නේ නම් ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියෙහි (CIDA) ලියාපදිංචි සහතිකයෙහි පිටපතක් හා බලයලත් මිනින්දෝරුවරයෙකු වශයෙන් ලියාපදිංචි වන්නේ නම් මැනුම් සභාව විසින් නිකුත් කරන ලද හැඳුනුමුපතෙහි පිටපතක්ද මෙයට අමුණා එවිය යුතුය. **(සියලු පිටපත් සත්‍ය පිටපත් බවට මුද්‍රා තබා සහතික කල යුතුය.)**

ලියාපදිංචි ගාස්තුව එවා ඇති චෙක්පතෙහි"

1. චෙක්පත් අංකය:.............................................................................
2. දිනය:.............................................................................
3. වටිනාකම:.............................................................................

සැපයුම්කරුවෙකු/ කොන්ත්‍රාත්කරුවෙකු ලෙස මා තෝරාගනු ලැබුවහොත් නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය විසින් නියෝග කරනු ලබන කොන්දෙසි හා නියමයන්ට යටත්ව නියමිත ආදර්ශයන්ට හා පිරිවිතරයන්ට අනුව 2026 වර්ෂයේ සිට භාණ්ඩ /ද්‍රව්‍ය/ සේවා/ කොන්ත්‍රාත් ඉටුකිරිමට/ සැපයීමට එකඟ වෙමි.

දිනය -

සැපයුම්කරුගේ අත්සන හා රබර් මුද්‍රාව

---

**කාර්යාලයේ ප්‍රයෝජනය සඳහා**

ගෙවූ ලියාපදිංචි ගාස්තු: රු.......................    ලදුපත් අංකය:....................................

ඉල්ලුම් පත්‍රය අනුමත කරමි.

දිනය -

සහකාර අධ්‍යක්ෂ (ප්‍රසම්පාදන)
(නා.ජ.සං.අ.)